සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

| මගේ අංකය / எனது இல / My No | ඔබේ අංකය / உமது இல / Your No | දිනය / திகதி / Date |
|---|---|---|
| DSD/HO/02/Pen/Com | | 2020.01.10 |

සියළුම සමෘද්ධි දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත විශ්‍රාම වැටුප් ගෙවීම.**

උක්ත කරුණට අදාළව මගේ අංක DSD/HO/02/AD/01/Circular හා 2019.04.04 දිනැති 03/2019 චක්‍ර ලේඛයෙන් ලබාදෙන ලද උපදෙස්වලට අමතර වශයෙනි.

02. ඒ අනුව පනතේ 44 (ඉ) ii වගන්තිය යටතේ අධිකාරියක මුල් පත්වීමේ දින සිට විශ්‍රාම වැටුප් හිමිකම සහිතව දෙපාර්තමේන්තුවට අන්තර්ග්‍රහණය වන නිලධාරීන් විසින් පනතේ සඳහන් කිසියම් අධිකාරියක මුල් පත්වීමේ දින සිට තම ගිණුම අවසන් කරන දින දක්වා සේවක අර්ථසාධක අරමුදලේ තමා නමින් තිබූ සම්පූර්ණ මුදලින් සියයට 60 ක් (60%) වන රාජ්‍ය දායකත්වය ආපසු රජයට ගෙවිය යුතු බව දන්වා ඇත.

03. මෙතෙක් මෙම මුදල් අය කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන ලද FORM RS ආකෘතියේ සඳහන් ශේෂය පදනම් කර ගනිමින් ප්‍රධාන කාර්යාලයේ මුදල් අයකැමි මගින් අධ්‍යක්ෂ ජනරාල්ගේ ගිණුමට බැර වන ලෙස අය කරන ලදී.

04. එසේ වුවද මෙම ගෙවීම් ක්‍රම වේදය තුළ කටයුතු කිරීමේදී මාර්ගස්ථ මුදල් සම්බන්ධයෙන් නිලධාරීන්හට යම් අවධානම් තත්වයන්ට මුහුණදීමට සිදු වන බවට පැමිණිලි ලැබී ඇත.

05. එබැවින් විධිමත් ලෙස සකස් කරන ලද විශ්‍රාම වැටුප් ලිපි ගොනුව ප්‍රධාන කාර්යාලය වෙත දැනට අනුගමනය කරනු ලබන ආකාරයට යොමු කිරීමෙන් අනතුරුව ගෙවිය යුතු මුදල් පිළිබඳ ලිඛිත දැනුම්දීමක් නිලධාරියා අවසන්වරට සේවය කරමින් සිට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත යොමු කිරීමට කටයුතු කරනු ඇත.

06. ඒ අනුව අදාළ දිස්ත්‍රික්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සමෘද්ධි නිල ගිණුම යටතේ පොදු තැන්පත් ගිණුමට මුදල් අය කර අධ්‍යක්ෂ ජනරාල් නමින් ලියන ලද චෙක් පතක් සහ චෙක්පත පිළිබඳ තොරතුරු ඇතුළත් ආවරණ ලිපියක් සමඟ ප්‍රධාන කාර්යාලයේ විශ්‍රාම වැටුප් ලිපි ගොනුව හරහා ගිණුම් අංශය වෙත යොමු කිරීමට කටයුතු කළයුතු බව දන්වමි.

07. එමෙන්ම කිසිදු අවස්ථාවක සෘජුව චෙක්පත් ගිණුම් අංශය වෙත යොමු නොකළ යුතු බවද වැඩිදුරටත් කාරුණිකව දන්වමි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී.බණ්ඩාර
අධ්‍යක්ෂ ජනරාල්.
පිටපත :- ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |
| | | Hot Line :0112-889007 | | | |